# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2080/64 - 2018 ජූලි මස 20 වැනි සිකුරාදා - 2018.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/10/2016/FH/33.
*මගේ අංකය* : BER/4/5/2/75.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශ්‍යතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 734ඒ- කුඩාපයාගල දකුණ ග්‍රාම නිලධාරි වසමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක ක. 4672 දරන පිඹුරේ කැබලි අංක 01.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: සමරප්පුවත්ත; විස්තර: ධීවර සේවා මධ්‍යස්ථානයක් සඳහා ඉඩම් අත්කර ගැනීම; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0537.

ඉහත සඳහන් ඉඩම්වලට/ පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 ඔක්තෝබර් මස 19 වැනි දින පෙ.ව. 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 ඔක්තෝබර් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. ඩී. චතුරමල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2018 ජූලි මස 16 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-258

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 9/3/1/1/3/6.
*ඉඩම් අමාත්‍යාංශ ලිපි ගොනු අංකය* : 4-3/4/2012/D-43.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 2060/11 හා 2018.02.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ අංක 1 A පිටුවේ සඳහන් කඩයිම් සිතියම් අංක 510028 (කලාප 4) හා පත්‍රය 7 හි කැබලි අංක 67 න් රජයට අත්පත් කර ගන්නා ප්‍රමාණය යතුරු ලියන දෝෂයක් මත හෙක්. 0.03856 ක් ලෙස සඳහන්ව ඇති අතර කඩයිම් සිතියම් අංක 510028 කලාප 4 හා පත්‍ර අංක 7 පිඹුරේ එම ප්‍රමාණය හෙක්. 0.3856 ක් ලෙස දැක්වෙන බැවින් කඩයිම් සිතියම් අංක 510028 (කලාප 4) හා පත්‍රය 7 හි කැබලි අංක 67 ට අදාළ ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 67**
ඉඩමේ නම: කිතුල්වලකන්ද; විස්තරය: ගෙවත්ත, අවු. 35 ක් පමණ වයසැති තේක්ක ගස් 3ක්,පොල්ගස් 28 ක්, අඹගස් 7ක්,කොස්ගස් 2ක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් හා වැසිකිළියක් ඇත; හිමිකම් කියන අය: කිතුල්වල ඉහළගම අංක 47/7 හි පදිංචි මොරවත්තගේ කමලාවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3856.

එච්. එම්. එල්. එස්. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය කොට්ඨාසය.

2018 ජූලි මස 13 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-259/1

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 9/3/1/1/3/6.
*ඉඩම් අමාත්‍යාංශයේ ලිපි ගොනු අංකය* : 4-3/2012/D-43.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 2060/11 හා 2018.02.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ අංක 2 A පිටුවේ සඳහන් කඩයිම් සිතියම් අංක 510061 (කලාප 3) හා පත්‍රය 3 හි කැබලි අංක 04 න් රජයට අත්පත් කර ගන්නා ප්‍රමාණය යතුරු ලියන දෝෂයක් මත හෙක්. 0.03186 ක් ලෙස සඳහන්ව ඇති අතර කඩයිම් සිතියම් අංක 510061 කලාප 3 හා පත්‍ර අංක 3 පිඹුරේ එම ප්‍රමාණය හෙක්. 0.3186 ක් ලෙස දැක්වෙන බැවින් කඩයිම් සිතියම් අංක 510061 (කලාප 3) හා පත්‍රය 3 හි කැබලි අංක 04 ට අදාළ ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 04**
ඉඩමේ නම: හල්පෙ කන්ද; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: එම්. පී. පෙමානිස්,නරියමුල්ල,මීරිගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3186.

එච්. එම්. එල්. එස්. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය කොට්ඨාසය.

2018 ජූලි මස 13 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-259/2

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රාදේශීය ලේකම් යොමු අංකය* : 6/3/7/15/21/6/23.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2007/MV/285A.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ 1957/22 හා 2016.03.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පල වූ ග.පි. 531,අතිරේක අංක 34, පත්‍ර 34 දරන සැලැස්මට අයත් කැබලි අංක 1689 හි ප්‍රමාණය හෙක්ටයාර් 0.033788 ක් ලෙස සඳහන් වුවද එය අත්පත් මූලික පිඹුරට අනුව හෙක්ටයාර් 0.0337 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල කොට්ඨාසය.

2018 ජූලි මස 04 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-260

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.